# අන්තර්ගතය

1919-1948 අතර කාල පරාසයේ මෙරට ජාතික ව්‍යාපාරය තුළ ක්‍රියාත්මක වූ රැඩිකල් තරුණ බලවේගයන්හි ක්‍රියාකාරීත්වය හා කාර්යභාරය පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ පරමාර්ථයයි. මෙහිදී මූලික වශයෙන් ම 1918 න් පසු ලංකාවේ ආරම්භ වන රැඩිකල් තරුණ සමිති ව්‍යාපාරය පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කරනු ඇත.

විසි වන සියවස මුල් අවධිය වන විට වෘද්ධෝපගත නායකත්වයෙන් ලංකාව තුළ ක්‍රියාත්මක වූ සටන්කාමී නොවුනු ජාතික ව්‍යාපාරය පිළිබඳව කලකිරීමට පත්වූ, රැඩිකල් අදහස් දැරූ තරුණ කොටසක්, ලාංකික තරුණ ව්‍යාපාරයට සටන්කාමී ප්‍රවිෂ්ටයක් ලබා දීමේ අපේක්ෂාවෙන් තරුණ සමිති ගොඩ නැගී ය. ආසියාවේ, යුරෝපයේ හා ඇමරිකාවේ ඇති වී තිබූ විප්ලවකාරී නිදහස් සටන් ව්‍යාපාරයන්ගෙනුත්, නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතිවාසිකම් වැනි තේමාවන් මුල් කර ගෙන ඒ රටවල බිහි වූ චින්තන සම්ප්‍රදායයන්ගෙන් ද ආභාසය ලබා තිබූ මෙම තරුණ පිරිස ලංකාවට පූර්ණ නිදහස අත්පත් කර ගැනීම සඳහා පුළුල් සටන්කාමී ව්‍යාපාරයන් දියත් කිරීමටත්, ඒ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මෙරට තරුණ ප්‍රජාව එක් ධජයක් යටතේ සංවිධානය කිරීමටත්, අපේක්ෂා කළේ ය. එසේ ම විවිධ සමාජ ශුභසාධන කටයුතු දියත් කිරීමටත්, යුරෝපීය පාලනය නිසා විනාශ වූ දේශීය අංගයන් නැවත නගා සිටුවීමටත් බලාපොරොත්තු වූහ. පළමුවෙන් ම දකුණේ සිංහල ප්‍රදේශවල ව්‍යාප්ත වූ තරුණ සමිති ඉන් අනතුරු ව උතුරේ යාපනය ප්‍රදේශයේ ද ආරම්භ විය. ආරම්භයේ සිට ම අධිරාජ්‍ය විරෝධී ස්වරූපයකින් ක්‍රියාත්මක වූ තරුණ සමිති කටයුතු, 1931 දී ගොඩ නැගූ "සමස්ත ලංකා තරුණ සමිති සම්මේලනය" ඔස්සේ වඩාත් සංවිධානාත්මක තත්වයකට පත් විය. මෙයින් පසුව වඩාත් ශක්තිමත් ව තරුණ සමිති කටයුතු ක්‍රියාත්මක විය. නමුත් තරුණ සමිති සම්මේලනය ක්‍රියාත්මක වූයේ ස්වල්ප කාලයක් පමණි. තරුණ සමිති අභ්‍යන්තරයේ හා ක්‍රියාකාරීත්වයේ ඇතිවූ විවධ තත්වයන් සහ බාහිරින් එල්ල වූ විවිධ අභියෝග හේතු කර ගෙන එක්දහස් නවසිය තිහේ දශකය මුල් අවධිය වන විට තරුණ ව්‍යාපාරය අකර්මන්‍ය වී ගියේය.

නමුත් මේ අවධිය වනවිට ලාංකික ජාතික ව්‍යාපාරයට මාක්ස්වාදී ආභාසයන් ලැබෙමින් පැවතුණි. මාක්ස්වාදී තරුණයින්ගේ නායකත්වය යටතේ අකර්මන්‍ය ව පැවති තරුණ ව්‍යාපාරය නැවත පුනර්ජීවනය ලැබී ය. ඔවුන් යටතේ පෙරට වඩා ශක්තිමත් ව හා සංවිධානාත්මක ව, න්‍යායාත්මක සංකල්ප ඔස්සේ තරුණ ව්‍යාපාරය පෙරට ගියේ ය. 1935 දී ඔවුන්ගේ මූලිකත්වයෙන් "සමසමාජ" පක්ෂය පිහිටුවීම තරුණ සමිති මුල් කර ගත් අධිරාජ්‍ය විරෝධී උද්ඝෝෂණ ව්‍යාපාරය තුළ වැදගත් ස්ථානයක් සනිටුහන් කළේ ය. පක්ෂ නායකත්වය යටතේ තරුණ සමිති කටයුතු වඩාත් පුළුල් තලයක පිහිටියේ ය. නාගරික හා වතු වැවිලි ක්ෂේත්‍රයේ කම්කරුවන් දේශපාලනික වශයෙන් සන්නද්ධ කරමින්,

ඔවුන්ගේ අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා නායකත්වය දීමට සමසමාජ පක්ෂය ඇපකැප වී ක්‍රියා කළේ ය. එසේ ම, රාජ්‍ය මන්ත්‍රණ සභාව තුළදීත්, පොදුජන උද්ඝෝෂණ සහ අධිරාජ්‍ය විරෝධී උද්ඝෝෂණ සඳහා අවතීර්ණ වීමට සමසමාජ නායකයෝ කටයුතු කළ හ.

එක්දහස් නවසිය තිහේ දශකය අවසාන වන විට, බ්‍රිතාන්‍යයන් වෙන ලෝක යුද්ධයට සම්බන්ධ වී සිටියේ ය. මෙරට සම්ප්‍රදායික නායකයෝ බ්‍රිතාන්‍යයන්ගේ යුද ජයග්‍රහණ සඳහා ඔවුන්ගේ උපරිම සහයෝගය ලබා දුන්හ. නමුත්, තරුණ සමිති මුල් කරගත් වාමාංශික නායකයෝ බ්‍රිතාන්‍යයන්ගේ යුදමය ක්‍රියාමාර්ග සේ ම සම්ප්‍රදායික නායකයන් ඒ සම්බන්ධයෙන් අනුගමනය කළ සහයෝගශීලි ප්‍රතිපත්තිය ද උග්‍ර විවේචනයට ලක් කළහ. ඔවුහු බ්‍රිතාන්‍ය විරෝධී පුලුල් උද්ඝෝෂණ ව්‍යාපාර රට තුළ සංවිධානය කළහ. සමසමාජ පක්ෂය ගෙන ගිය අභියෝගාත්මක ව්‍යාපාර නිසා බ්‍රිතාන්‍ය රජය සමසමාජ නායකයින් අත් අඩංගුවට ගෙන, පක්ෂය තහනම් කරමින් උග්‍ර රාජ්‍ය මර්දනයක් ක්‍රියාත්මක කළේ ය. මේ තත්වය නිසා 1945 පමණ වනතුරු වාමාංශික ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය දුර්වල වී පැවතිණි.

දෙවන ලෝක යුද්ධය අවසානයෙන් පසු ව, දකුණු ආසියාවේ ඇති වූ දේශපාලන වෙනස්කම් මධ්‍යයේ ශ්‍රී ලංකාවට නිදහස ප්‍රදානය කිරීමට බ්‍රිතාන්‍ය පාලකයින් කටයුතු කළ අතර, තමන්ට පක්ෂපාති වූ සාම්ප්‍රදායික දේශීය නායකයන්ට බලය පැවරීම තුළින් මෙරට බ්‍රිතාන්‍ය අයිතිවාසිකම් ආරක්ෂා වෙතැ යි ඔවුහු කල්පනා කළ හ. මේ පසුබිමේ සාම්ප්‍රදායික නායකයෝ මහත් ප්‍රීතියෙන් එකී ප්‍රදාන භාර ගත්හ. නමුත් එම අවස්ථාවේ තරුණ සංවිධාන මුල් කරගත් වාමාංශික නායකයෝ ඊට එරෙහි ව කරුණු පැහැදිලි කරමින් පූර්ණ නිදහස ලබා ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දුන්හ.